# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 8 ශ්‍රේණිය

## කතෝලික ධර්මය     කාලය :පැය 2 යි

1 කොටස

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. සකරියස් තුමාගේ යාග පූජාවෙන් ආරම්භ වන ශුභාරංචිය වන්නේ,
   (1) ශු. මතෙව් ශුභාරංචිය (2) ශු. ලූක් ශුභාරංචිය (3) ශු. මාක් ශුභාරංචිය (4) ශු. ජොහන් ශුභාරංචිය

2. ශු. මාක් ශුභාරංචියේ සංකේතය වන්නේ,
   (1) ගවයා (2) රාජාලියා (3) මිනිසා (4) සිංහයා

3. ස්නාවක ජුවාම් තුමාව සිරගත කරනු ලැබුවේ,
   (1) මහ හෙරෝද් (2) පොන්සියු පිලාත් (3) හෙරෝද් ඇන්ටිපස් (4) හෙරෝද් පිලිප්

4. ජේසුස් වහන්සේ නාසරෙත් හි දේශනාව සඳහා යොදා ගත් ග්‍රන්ථය වන්නේ
   (1) දිවැසිවර යෙසායාගේ ග්‍රන්ථය (2) දිවැසිවර ජෙරමියාගේ ග්‍රන්ථය
   (3) ශුද්ධ වූ ජොහන් තුමාගේ ශුභාරංචිය (4) ශු. ලූක් ශුභාරංචිය

5. " ශුද්ධාත්මයාණන්ගේ මුද්‍රාව ලබා ගන්න" යයි පවසමින් දානය කරන දේව ප්‍රසාද නිධානය වන්නේ,
   (1) ප්‍රසාද ස්නාපනය (2) පූජකවරය (3) අභිවෘද්ධි ආලේපය (4) රෝගීන්ගේ ආලේපය

6. ස්නාවක ජුවාම් තුමා විසින් " එම්බා පොළොං වංශය " කියා ඇමතූ ජන කොට්ඨාසය වන්නේ,
   (1) පව්කාර මිනිසුන් ය (2) මනස්තාප නොවූවන් ය.
   (3) ප්‍රභූ ජනතාව ය (4) අයකැමියන් ය.

7. ජුසේතුමා මරිය තුමියව රහසින් අත හැරීමට ගත් තීරණය වෙනස් කළේ,
   (1) මරිය තුමිය කෙරෙහි අනුකම්පාවෙනි (2) මරියතුමියගේ ඉල්ලීම නිසාවෙනි.
   (3) නෑදෑයින්ගේ ඉල්ලීම නිසාවෙනි (4) දේව දූතයන්ගේ පණිවිඩය නිසාවෙනි

8. "ඔබට ලැබෙන වැටුපෙන් සෑහී සිටින්න" ස්නාවක ජුවාම් තුමා මෙසේ පවසන්නේ,
   (1) සාමාන්‍ය ජනතාවට (2) හමුදා නිලධාරීන්ට (3) බදු අය කරන්නන්ට (4) පරිසිවරුන්ට

9. "ගැලවුම්කරුවාණන් බෙත්ලෙහෙමෙ හි උපත ලබන බව " ට දිවැසි වැකි කී දිවැසිවරයා වන්නේ,
   (1) මීකා (2) යෙසායා (3) නාතාන් (4) සෙකරියා

10. ජේසුස් වහන්සේගේ ධර්මදූත සේවාව තුළ පව්කරුවන්ට දයාව දැක්වූ බව ශු. ලූක් තුමා පෙන්වා දෙන නිසා ශු. ලූක් ශුභාරංචිය මෙලෙස හඳුන්වයි,
   (1) අන්‍ය ජාතීන්ගේ ශුභාරංචිය (2) දයාවේ ශුභාරංචිය
   (3) දිළිඳුන්ගේ ශුභාරංචිය (4) කොන්වූවන්ගේ ශුභාරංචිය

11. ජොර්දාන් නදියේදී බෞතීස්ම ස්නාපනය ලැබීමෙන් පසු ජේසුස් වහන්සේ ගියේ,
   (1) ගලීලයට (2) නාසරෙත් ග්‍රාමයට (3) පාළුකරයට (4) ජෙරුසලමට

12. අපගේ ජීවිතවල ප්‍රාතිහාර්ය අත්දැකීමට අවශ්‍ය වන්නේ,
   (1) ආත්මික භක්ති අභ්‍යාස (2) සාන්තුවර භක්තිය (3) නිරාහාරශීලය රැකීම (4) දේව විශ්වාසය

13. දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණයක් නොවන්නේ
   (1) භෝජනයකි (2) ස්තුති කිරීමකි (3) සිහි කිරීමකි (4) ගෞරව කිරීමකි

14. පහත සඳහන් දෑ අතරින් ශුද්ධාත්ම ඵලයක් නොවන්නේ,
   (1) කරුණාව (2) මර්යදාවය (3) ඉවසීම (4) ධෛර්ය

15. අභිවෘද්ධි ආලේපය ලැබීමේදී ක්‍රිස්මා තෛලයෙන් ආලේප කරනු ලබන්නේ,
(1) නළල (2) දෑත (3) පපුව (4) හිස

16. අභිවෘද්ධි ආලේපය නැමති දේව ප්‍රසාද නිධානය ලැබීම සඳහා අප සම්පූර්ණ කළ යුතු වයස වන්නේ,
(1) අවුරුදු 18 (2) අවුරුදු 16 (3) අවුරුදු 14 (4) අවුරුදු 20

17. ආත්මයේ නොමැකෙන ලාංඡනයක් සනිටුහන් වන දේව ප්‍රසාද නිධානයක් වන්නේ,
(1) අභිවෘද්ධි ආලේපය (2) රෝගීන්ගේ ආලේපය (3) දිව්‍ය සත්ප්‍රසාදය (4) පාපොච්චාරණය

18. කතෝලික ජනවන්දනාවේ කේන්ද්‍රස්ථානය හිමි වන්නේ ,
(1) යාම යැදුමට (2) සක්‍රමේන්තු වලට (3) දිව්‍ය පූජාවට (4) මංගල්‍යයන්ට

19. මාරුත දමනය ප්‍රාතිහාර්‍යය මගින් අප දැනගත යුත්තේ,
(1) උන්වහන්සේ අන් හැමට වඩා උසස් බව (2) උන්වහන්සේ සිය බලය අන් අයට දන්වන බව
(3) උන්වහන්සේ දේව පුත්‍රයා බව (4) උන්වහන්සේට සියල්ල කළ හැකි බව

20. ජේසුස් වහන්සේගේ වචන හා ක්‍රියාවල හරය වූයේ
(1) දේව රාජ්‍යයේ උදාවයි (2) සහෝදරත්වයයි (3) උත්ථානයයි (4) එකමුතුකමයි

## දෙවන කොටස

**පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

1. (1) දිව්‍ය සත්ප්‍රසාදයට පූර්ව සලකුණු 2 ක් ලියන්න. (ලකුණු 4)
(2) ශුද්ධ වූ ලූක් ශුභාරංචියේ දැක්වෙන ජුදා චාරිත්‍ර 2 ක් ලියන්න. (ලකුණු 4)
(3) ශුද්ධාත්ම දීමනා 4 ක් ලියන්න. (ලකුණු 4)
(4) ඔබ අන් අයට ජේසුව හඳුන්වා දෙන අකාර 4 ක් ලියන්න. (ලකුණු 4)
(5) අභිවෘද්ධි ආලේපය පිළිවෙතේ විශේෂ අවස්ථා 2 ක් ලියන්න. (ලකුණු 4)

2. (1) ප්‍රාතිහාර්යයක් යනු කුමක්දැයි හඳුන්වන්න.
(2) ප්‍රාතිහාර්යය වර්ග 3 ක් නම් කරන්න.
(3) ඔබ දෙවියන් වහන්සේගේ බලය අත්දුටු අවස්ථාවක් විස්තර කරන්න
(ලකුණු 2+3+5=10)

3. (1) සත්‍ය විශ්වාසයේ අපව ස්ථිර කර පූර්ණ ක්‍රිස්තු භක්තිකයන් කරන සක්‍රමේන්තුව නම් කරන්න
(2) පෙන්තකොස්ත දිනයේ අපෝස්තුලුවරුන් මත ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණි බවට සංකේත 3 ක් ලියන්න
(3) විභාගයට මුහුණ දීමට අවශ්‍ය ශුද්ධාත්ම වරම් ඉල්ලා යාච්ඤාවක් ලියන්න.
(ලකුණු 2+3+5=10)

4. (1) දේව රාජ්‍යය යනු කුමක්ද?
(2) දේව රාජ්‍යයේ වටිනාකම් ඉදිරිපත් කරන උපමා කතා 3 ක් නම් කරන්න.
(3) දේව රාජ්‍යයේ වටිනාකම් අයිති කර ගැනීමට ඔබට කළ හැකි දේවල් 5 ක් ලියන්න.
(ලකුණු 2+3+5=10)

5. (1) ශුද්ධ වූ ලූක් තුමාගේ ශුභාරංචියේ පරමාර්ථය ලියන්න.
(2) ශුද්ධ වූ ලූක් ශුභාරංචිය හඳුන්වන වෙනත් නම් 3 ක් ලියන්න.
(3) ජේසුස් වහන්සේ හා සමීප සම්බන්ධතාවයක් ඇති කර ගැනීම සඳහා ඔබට කළ හැකි දේවල් 5 ක් ලියන්න
(ලකුණු 2+3+5=10)

6. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
(1) ස්නාවක පුවාම් තුමා (2) ශුද්ධ වූ ලූක් තුමා
(3) ශු. ලූක් ශුභාරංචියේ සැලැස්ම (4) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ
(ලකුණු 5+5=10)